**පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව - 2023**

**----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංවර්ධන ව්‍යාපෘති 03ක පිරිවැය රු.3,525,745ක් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ ගිණුම් සැකසීමේදී නිවැරදි කරමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | ගබඩාවෙන් නිකුත් කළ රු.2,218,882ක තොග අදාළ වැය ශීර්ෂයට හර කිරීම වෙනුවට සමුච්චිත අරමුදලට හර කර තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සභාව සතු පර්චස් 8.44ක ඉඩම් 02ක් හා ගොඩනැගිලි 05ක් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී තක්සේරු කර ගිණුම්ගත කරමි. | -එම- |
| (ඈ) | ගිණුම් විෂයයන් 05ක සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ සහ උපයෝගී ලේඛන අනුව ශේෂ අතර රු.8,473,858ක වෙනසක් විය. | මෙම වෙනස්කම්වලට හේතු හඳුනාගෙන නිරවුල් කරමි. | -එම- |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.142,092,917ක් වූ ගිණුම් විෂයයන් 05ක විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකෙරුණි. | ඉදිරි ගිණුම් වර්ෂයේදී ඉදිරිපත් කිරීමට උත්සාහ කරමි. | අදාළ උපලේඛන සකස් කළ යුතු වේ. |

## 1.7 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 571 (2) හා (3) අනුව, 2007 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළ කල් ඉකුත් වූ විවිධ | ඉදිරියේදී සියලු තැන්පතු පිළිබඳ සොයා බලා අවස්ථානුකූලව ආදායමට | මුදල් රෙගුලාසි අනුව කටයුතු |

| | | |
|---|---|---|
| තැන්පතු රු.1,126,095ක් නොතිබුණි. | නිරවුල් කර ගනිමි. | කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.60,113 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.14,019,656ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 6,697,910 | 7,156,137 | 8,391,531 | 5,677,960 | 6,969,060 | 6,898,956 | 8,375,701 | 6,997,407 |
| කුලී | 4,572,640 | 3,828,250 | 3,730,008 | 1,719,100 | 3,332,640 | 2,578,415 | 2,521,265 | 1,559,859 |
| බලපත්‍ර ගාස්තු | 2,527,700 | 3,516,277 | 3,515,277 | - | 1,041,000 | 1,901,782 | 1,901,782 | - |
| වෙනත් ආදායම් | 860,000 | 1,446,736 | 1,378,708 | 147,754 | 6,644,000 | 6,871,030 | 6,791,304 | - |
| | 14,658,250 | 15,947,400 | 17,015,524 | 7,544,814 | 17,986,700 | 18,250,183 | 19,590,052 | 8,557,266 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.233,080ක් වූ හිඟ අක්කර බදු ශේෂය තුළ වසර 03කට වඩා පැරණි රු.214,472ක ශේෂයක් විය. | මේ සම්බන්ධයෙන් ලේඛන පරීක්ෂාවක් සිදු කෙරේ. ඒ අනුව, හිඟ අයකර ගනිමි. | හිඟ ආදායම් නොපමාව අය කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ත්‍රීරෝද රථ නැවතුම් ස්ථාන 38ක ලියාපදිංචි ත්‍රීරෝද රථ 762කින් රු.882,750ක නැවැතුම් ගාස්තු හිඟව පැවැතිණි. | නැවත ත්‍රී රෝද රථ සංගම්වල නිලධාරීන් කැඳවා සාකච්ඡා කර ඉදිරි ක්‍රියාමාර්ග ගනිමි. | - එම - |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අවිධිමත් ගනුදනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ හිටපු සභාපතිවරයාට ලබා දී තිබුණු රු.123,290ක් වූ ලැප්ටොප් පරිගණකය හා ජංගම දුරකථනය මෙන්ම උප සභාපති වෙත ලබා දී තිබුණු රු.52,250ක් වූ ජංගම දුරකථනය 2023 ඔක්තෝබර් වන විටත් සභාව වෙත භාර දී නොතිබුණි. | ඔවුන් වෙතම එම උපකරණ ලබාදීමට අනුමැතිය ලබා ගැනීම සඳහා ආණ්ඩුකාරතුමා වෙත යොමුකර ඇත. | සභාවේ වත්කම් ආපසු ලබා ගැනීමට කටයුතු කළයුතු වේ. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නිවාස යෝජනා ක්‍රමයක් වෙනුවෙන් 2005 හා 2007 වර්ෂවල දී රු.204,229ක මූලික වියදමක් සිදුකර තිබුණ ද මේ දක්වාම එම ඉඩම් කොටස් විධිමත්ව පවරා නොතිබුණි. | මෙය ඉටු වී නොමැති බවට රේඛීය අමාත්‍යාංශා විසින් ද දන්වා ඇත.පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සමඟ ඉදිරි කටයුතු සිදු කිරීමට අපේක්ෂා කෙරේ. | ඉඩම් කොටස් විධිමත්ව පවරා දීමට කටයුතු කළ යුතු වේ. |

### 3.3 නිෂ්කාර්යය වත්කම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නොදිරන කසළ මධ්‍යස්ථානය සඳහා 2022 ජූලි ලද රු.950,000ක බේලර් යන්ත්‍රය තෙකලා විදුලිය නොමැති වීමෙන් 2023 නොවැම්බර් වන විටත් සභා භූමිය තුළ නිෂ්කාර්යයව පැවැතිණි. | විදුලිය ලද වහාම බේලර් යන්ත්‍රයේ වැඩ ආරම්භ කරමි. | වත්කම් අභාවිතව නොතැබිය යුතු වේ. |

**3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| නොකළ වැඩ වෙනුවෙන් රු.92,233ක් ගෙවා තිබුණි. | එකී වැඩ විෂයයන් සඳහා වැඩිපුර ගෙවීමක් සිදු කර නොමැත. | වැඩිපුර ගෙවීම් ආපසු අය කළ යුතු වේ. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| හිටපු සභිකයෙකු සහ නිලධාරීන් තිදෙනෙකු විසින් 1994 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලය තුළ ලබාගත් ණය මුදලින් හිඟහිටි රු.101,384ක් සමාලෝචිත වර්ෂය තුළ දී ද, අයකර නොතිබුණි. | ණයකරුවන් සම්බන්ධයෙන් තවදුරටත් තොරතුරු රැස් කරමින් පවතින අතර, නිරවුල් කිරීමට ක්‍රියාකරමි. | හිඟ ණය ශේෂ පියවා ගැනීමට කටයුතු කළයුතු වේ. |